ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2014 නොවැම්බර් 24 සඳුදා
07 වෙළුම - 05 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 36/ News/ 2014

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



# පුංචි අපිත් ආගමන කාලයට සූදානම් වෙමු !

Lama Pradeepaya

ළමා ප්‍රදීපය
ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් lamapradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# පාප් වහන්සේගේ නිලයේ බලතල කතෝලික දහම් ඇසින්.

## ආදරණීය දුවේ පුතේ...

පාප් වහන්සේගේ නිලයේ බලතල ගැන සඳහන් වන්නේ අපේ කතෝලික සභාවේ තිබෙන ශාසන නීති සංග්‍රහයේයි. එම ශාසන නීති සංග්‍රහයේ 331 වෙනි වගන්තිය සමන්විත වන්නේ මෙහෙමයි. ''පාප්තුමාට සභාව තුළ, එතුමාගේ නිල බලයෙන්ම, උත්තරීතර, සම්පූර්ණ, සෘජු හා විශ්ව නිල බලය හිමිවේ.'' ඉතින් පුංචි ඔබත් මුලින්ම මේ කතෝලික සභාවේ ශාසන නීති සංග්‍රහයේ සඳහන් මේ වගන්තිය ඔබේම අවබෝධය අනුව විග්‍රහ කරන්නට උත්සහයක් ගන්න ඕනා.

ආදර දුවේ පුතේ, උත්තරීතර (Supreme) යන්නෙන් අදහස් කරන්නේ එතුමා සභාව තුළ වෙනත් කිසිම අධිකාරියකට යටත් හෝ උපකාරක නොවන බවයි. පාප් වහන්සේගේ බලය සම්පූර්ණ (Full) යන්නෙහි අදහස වන්නේ සභාව තුළ කුමන හෝ ක්ෂේත්‍රයක ගැටළු හා ප්‍රශ්ණ නිරාකරණය කිරීමට එතුමාට ඇති බලයයි. එම බලය සෘජු (Immediate) බලය ලෙස හැඳින්වෙනවා. එනම් එම බලය ක්‍රියාත්මක කිරීම සඳහා කිසිම අතරමැදියෙකුගේ අවශ්‍යතාවයක් නොමැති බවයි. එකී බලය සමස්ත සභාවටම බලපාන නිසා එය විශ්ව (Universal) බලය ලෙස නම් කෙරෙනවා. එසේම එය නිල (Ordinary) බලයකි. එය අපි තේරුම් ගත යුත්තේ මෙහෙමයි. මේ බලය සභාවේ වෙනත් කවුරුන් හෝ විසින් එතුමාණන් පිට පැවරුවක් නොව ක්‍රිස්තුන් වහන්සේගෙන්ම ලැබෙන බලයක්. එම නිසා එය අසාමාන්‍ය නොව සාමන්‍ය නිල බලයක් බව අවබෝධ කර ගත යුතුයි.

ආදර දුවේ පුතේ, මේ බලය කුමක් සඳහාද? අපට මෙය සාමාන්‍ය සමාජය විග්‍රහ කරන අර්ථයෙන්ම විග්‍රහ කර අවබෝධ කර ගන්න බැහැ. විශේෂයෙන්ම මෙලොව පවතින , සමාජීය, හෝ දේශපාලනික හෝ බලතල හා සම්බන්ධ කරමින් පාප් නිල හා එහි බලතල ගැන විග්‍රහ කරන්නට උත්සහ කළහොත් කෙනෙකුට එය අත්තනෝමතික බලයක් හෝ නායකත්වයක් ලෙස පෙනී යන්නට පුළුවන්. නමුත් එය එසේ වන්නේ නැහැ. පාප් ධූරයේ බලතල නිර්වචනය කළ හැක්ක් කිතුනු නායකත්වය නැමැති අඩිතාලම මත පිහිටා පමණයි. කතෝලික අපට මෙය තේරුම් ගැනීමට කිසිම අපහසුවක් නැහැ. මන්ද කිතුනු නායකත්වය කුමක්ද යන්න ශු. බයිබලයේ සුවිශේෂක ජුවාම් තුමාගේ සුවිශේෂයේ ඉතාමත්ම පැහැදිලිව සඳහන් වෙනවා.

''මම යහපත් එඬේරා වෙමි. යහපත් එඬේරා සිය බැටළුවන් උදෙසා සවකීය ජීවිතය පුජා කරයි.'' (ජුවාම් 10/11) එම නිසා ආදර දුවේ පුතේ කිතුනු නායකත්වය රැඳී තිබෙන් නේ ජනතාව වෙනුවෙන් කැපවීමට, වැයවීමට, සේවය කිරීමට, අවසානයේ ජීවිතය වුවත් පුජා කිරීමට එකී නායකත්වය සඳහා කැඳවනු ලැබුවන්ගේ සුදනම හා කැමැත්ත මතයි. බැටළු රැළක පැවැත්ම, ආරක්‍ෂාව, පෝෂණය..... මේ හැම දෙයක්ම මුළු මනින්ම රැදී පවතින්නේ එඬේරා මත මෙන්ම පාප් නිලය ජනතාව මත රැදෙන අතර, කිතුනු විශ්වාසිකයින් පාප් නිලය මත රැදෙනවා. ඉතින් මෙම එඬේරික දූත සේවාව සඳහා පාප් වහන්සේ ශක්තිය, පන්නරය ලබා ගන්නේ ක්‍රිස්තුන් වහන්සේ මත යැපීමෙන් හා උන්වහන්සේව අනුගමනය කිරීමෙන් මයි. එම නිසා පාප් නිලයේ බලතල යනු පාප්වහන්සේ ක්‍රිස්තුන් වහන්සේව අනුසාර කරමින්, තම අනුගාමිකත්වයෙන් ජනතාව ක්‍රිස්තුන් වහන්සේ කරා යොමු කිරීමේ දූත සේවාවයි.

පාප්වහන්සේ සභාව තුළ සවකීය නායකත්වය ක්‍රියාත්මක කරන්නේ සභාවේ එකමුතුකමේ හා සාර්වත්‍රිකත්වයේ (universality) සේවකයෙකු වීමෙනි. එම නිසා එතුමා සමස්ත සභාව තුළ ඒකත්වය ගොඩ නැගීමටත්, ඒ තුළ ඇති විවිධත්වය ඒකත්වය කරා යොමු කරවීමේ දූත සේවාවේ යෙදී සිටිනවා. මන්ද, එතුමාගේ නායකත්වය තමන් විසින්ම සොයා ලබා ගන්නක් හෝ ජනතාව විසින් එතුමාට පවරා දෙනු ලැබුවක් නොව, ක්‍රිස්තුන් වහන්සේම ශු. පේදුරු තුමාටත් එතුමන්ගෙන් පසු එම නායකත්වයට පත්වුවන්ටත් ලබා දුන් බලයක් නිසාමයි.

''මාගේ '' බැටළුවන් පෝෂණය කරන්න. ''මාගේ'' යතුර ඔබට දෙමියි වදරමින් ක්‍රිස්තුන් වහන්සේ පේදුරුතුමා පිට බලය පැවරුවේ ඒ නිසායි. තම ස්වාමියාණන් වන ක්‍රිස්තුන් වහන්සේට පක්ෂපාතිව, එතුමන් විසින් තමන්ට පවරා දුන් බලය, එකී ගුරු දේවයාණන්ගේ ජනතාවගේ යහපත වෙනුවෙන් වැය කිරීම පාප් නිලය සතු බලයේ වගකීමයි. එම නිසා ජනතාව ගැන පාප්වහන්සේ සෘජුවම වගකිව යුත්තේ ක්‍රිස්තුන් වහන් සේටයි. පාප්වහන්සේ අන් හැමටම පෙර කීකරු විය යුත්තේ හා සවන් දිය යුත්තේ ක්‍රිස්තුන් වහන්සේටයි. අති උතුම් ප්‍රැන්සිස් පාප්වහන්සේගේ 2015 ලංකාගමනට පෙර අපිත් එතුමන්ගේ මේ නිල බලය ගැන තවත් දැනුම්වත් වෙන්න ඕනා. ළමා ප්‍රදීපය කවදත් ඔබට කාලීනව අවශ්‍ය දැනුම ලබා දෙන්නට පසුබට වන්නේ නැහැ.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# භාග්‍යවරයට පත් කවුන්සිලයේ පාප්තුමා

**පසුගිය සතියෙන්**



නැවතත් නව ආරම්භයක් හා නව දැක්මක් තුළ එතුමෝ වතිකාන කතිකාවතට නව ජීවයක් දී පණ ගැන්වූහ. සියළු පාර්ශවයන්ගේ අදහස්, උදහස්, යෝජනා, චෝදනා විමසා බැලු එතුමා සභාවට නව දැක්මක් ලබා දෙමින් ක්‍රි.ව. 1965 දී දෙවන ජගත් වතිකාන කතිකාවතට සාර්ථක අවසානයක් ලබා දුන්නේය. කතිකාවතේ ඉගැන්වීම් හා දැක්ම ඉදිරිපත් කරමින් ප්‍රකාශන දහසයක් ඉදිරිපත් කළ එතුමෝ එකී ඉගැන්වීම් අනුසාර කිරීමට විවිධ රට රාජ්‍යයන් තුළ සංචාරය කළහ. ඉතාලියෙන් පිට ගුවන් යානයකින් සංචාරය කළ පළමු පාප්තුමා වෙන්නේද මෙතුමන්ය. ක්‍රි.ව. 1970 දී හයවන පාවුළු පාප්තුමා අප සිරිලක් දෙරණට වැඩම කළේය.

අති උතුම් හයවන පාවුළු පාප්තුමා දේවමාතාවන් කෙරෙහි ඉතා ගැඹුරු ආදරයක් හා භක්තියක් දැක් වූ සභා පිතෘවරයෙකි. කතෝලික සභාව තුළ මරිය දහම වඩා වඩාත් ශක්තිමත් කිරීමට හා මරිය බැතිය ප්‍රබෝධවත් කිරීමට එතුමෝ මරිය දහම පිළිබඳ කොංග්‍රස, සමුළු වලට සහභාගි වෙමින්ද, දේව මාතා වහන්සේට කැප කොට ඇති සිද්ධස්ථාන නිරන්තරයෙන් බැහැදකිමින් ද මරිය තුමිය පිළිබඳ විශ්ව ලේඛන නිකුත් කරමින්ද දායක වූහ. මිලානයේ හිටපු අගරදගුරුතුමෙකු වූ සාන්ත අම්බ්‍රෝස් තුමන්ගේ අඩිපාරේ ගමන් කරමින් එතුමා දෙවන ජගත් වතිකාන කතිකාවත අතරතුර මරිය තුමියව "සාන්ත සභාවේ මාතාව" වශයෙන් ප්‍රකාශයට පත් කළේය.

තම සසුන් පිය කාල පරිච්ඡේදය පුරා ලෝකය සමඟ විවෘත සංවාදයක් ගොඩනගා ගත් එතුමා සෙසු ක්‍රිස්තියානි සභාවන් සමඟද, අනෙකුත් ආගම් සමඟද අදේවාදීන් සමඟද සමීප සබඳතා පැවැත්විය. විශේෂයෙන්ම උපත් පාලනය සම්බන්ධයෙන් එතුමා ඉදිරිපත් කළ අදහස් එසමයෙහි මහත් ආන්දෝලනයට ලක්විය. මනුෂ්‍ය ජීවිතයේ වටිනාකම හුවා දක්වමින් එතුමා නිකුත් කළ Humanae Vitae (හුමානේ විටේ - 1968) විශ්ව ලේඛනයද ජනතාවගෙග් පූර්ණ සංවර්ධනය සම්බන්ධයෙන් නම අදහස් ඉදිරිපත් කරමින් නිකුත් කළ Populorum Progressio (පොපුලෝරුම් ප්‍රොගෙස්සියෝ-ජනතා ප්‍රගතිය-1967) විශ්ව ලේඛනයද අදටත් බොහෝ දෙනා අතර කතා බහට ලක්වේ.

වසර පහළොවකට ආසන්න කාලයක් ලෝකය තුළ ක්‍රිස්තු ප්‍රේමය, සත්‍යය, දයාව, සාධාරණත්වය හා සාමය ස්ථාපිත කිරීම සඳහා අනලස්ව, උද්‍යෝගිමත්ව ක්‍රියා කළ අති උත්තම හයවන පාවුළු පාප්තුමා ක්‍රි.ව. 1978 අගෝස්තු 06 දින එනම් කිතු සමිඳුන්ගේ අන්‍යරූප විලාශ වීමේ මංගල්‍යය සමරන ඉරුදින ස්වර්ගස්ථ විය. ක්‍රි.ව. 1993 මැයි 11 වන දින සාන්ත දෙවන ජුවාම් පාවුළු පාප්තුමා ඇරඹූ හයවන පාවුළු පාප්තුමන් භාග්‍යවරයට එසවීමේ ශාසනික ක්‍රියාදාමය ක්‍රි.ව. 2012 දෙසැම්බර් 20 අති උතුම් සොළොස්වන බෙනඩික් පාප්තුමා එතුමාන්ව වන්දනීය තත්ත්වයට ඔසවනු ලැබීමත් සමඟ වඩා තීව්‍ර වී ක්‍රි.ව. 2014 මැයි 09 අති උතුම් ප්‍රැන්සිස් සුදතුම් පියාණන් විසින් භාග්‍යවරය සඳහා අනුමැතිය ප්‍රදානය කරන ලදී.

පසුගියදා (ඔක්තෝම්බර් 19) වන දින රදගුරු සිනඩ් සභාව අවසානයේදී අති උතුම් ප්‍රැන්සිස් පාප්තුමන් විසින් වන්දනීය හයවන පාවුළු පාප්තුමන්ව භාග්‍යවරයට ඔසවනු ලැබිනි. සාන්තුවරය කරා පියමං කරන පාප්වරුන් අතර එකී මහිමය උරුම කර ගන්නා ඊළඟ උරුමකරුවා භාග්‍යවන්ත හයවන පාවුළු පාප්තුමන් යැයි අපට කිව හැකි නොවේද?

දිනේෂ් පෙරේරා - දළුගම

## හලාවත පදවිය



හලාවත මීසමේ, වට්ටක්කුලිය ශා. ජුසේවාස් මුනිඳුන්ගේ දහම් පාසලේ දරු දැරියෝ 23 ක් පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. මීසම් සේවක ගරු ලින්ටන් නිහාල් ප්‍රනාන්දු, මීසම් සහයක ගරු ලූර් ප්‍රනාන්දු පියතුමන්ලා ගරු ඇලැක්සියා පැවිදි සොයුරිය සමඟ දහම් පාසලේ ගුරුභවතුන් ළමුන් සමඟ සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු.



# පළමු වරට දිව බොදුන් ලැබීම

## අනුරාධපුර පදවිය



හිඟුරක්ගොඩ ක්‍රිස්තු රජාණන්ගේ දහම් පාසලේ ළමෝ 20 ක් පසු ගියද ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. ළමුන් මීසම් සේවක ගරු එරික් ප්‍රනාන්දු පියතුමා, ගරු මාග්‍රට් පැවිදි සොයුරිය, ළමුන් සූදානම් කළ ගරු ස්වර්ණා පැවිදි සොයුරිය සමග දහම් ගුරුවර ගුරුවරියන් සමූහ සේයා රුවකට පෙනී සිටි අයුරු.

**සේයා - දිලීප රොෂාන්**
**සටහන - ජෝශප් ඇන්ටනි**

## කොළඹ පදවිය



මහරගම ශාන්ත මරියා දේවස්ථානයේ ළමෝ 24 ක් පළමුවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. ළමුන්, මීසම් සේවක ගරු ජූඩ් නික්ලස් පියතුමා සහ ගරු පැවිදි සොයුරියන් සමඟ සමූහ සේයාරුවකට මුහුණදුන් අයුරු.

# "ළමා ප්‍රදීපය"



"හැපි බර්ත් ඩේ ටු යූ" කියලා විනිතා ඇන්ටිලාගේ ගෙවල් පැත්තෙන් ඇසුණු ගමන් අල්ලපු ගෙවල්වල අයත් ඔළුව දලා බලන්න ගත්තා. "මොකද මේ හිටි ගමන්" "කාගේ උපන් දිනයක්ද? කාටත් ප්‍රශ්ණයක් ? ලැටීෂියා, මිනොන්, වික්ටර්, විනිතා, ඇන්ටිගේ දරුවෝ එයාලාගේ තාත්තා ජෑන්ස්, කව්රුත් වැට අයිනට ඇවිල්ලා බැලුවේ විනිතා ඇන්ටිලාගේ ගෙදර කාගේද උත්සවය කියලයි. අල්ලපු වැටේ ගෙවල් වල හිටපු පැංචො, පැංචියො ලැටීෂියා , මිනොන් සහ වික්ටර්ගේ මිතුරු-මිතුරියේ .මෙයාලාගේ තාත්තා "ළමා ප්‍රදීපය" ගෙදර ගෙනවිල්ලා පුටුවක් උඩ හිඳගෙන දිග හැරලා බලන්න ඉන්නවා අනික් ඇයෝ සුබ පැතුවා පසුව යාච්ඤා කළා.

"මේ මොකද වෙන්නේ" වැට අයිනේ පුංචි ඇයෝ බලන් ඉන්නව දුටු විනිතා ඇන්ටි මේ අයට කතා කළා. "ඇයි ඔතැනට වෙලා, මෙහෙට එන්න" කිව්වා විතරයි පොඩි ඇයෝ ටික රූං ගලා එහෙට දිව්වා. "ඇයි ඇන්ටි කාගෙ බර්ත් ඩේ එකද? "පැංචියෙක් අහුවා. එතකොටම ලැටීෂියයි, මෙනොනුයි, වික්ටරුයි දුවගෙන ආවා. "ආ එන්න, එන්න, තුන් දෙනාම එකවරම එකහඬින් කිව්වා. මෙයාලාගේ සාලේ මැද මහා කාල ගෝට්ටියක් , කට්ටිය ටික , ටික ළංවෙලා බැළුවා පුදුමකාරණේ තමයි උපන් දිනය කාලෙද කියලා දන්නෙ නැති එක. විනිතා ඇන්ටිගේ මහත්තයා ජැන්ස් අංකල්, "ළමා ප්‍රදීපය" අතැතිව හිටියා. ජැන්ස් අංකල් මේ අතරේ දෙඩමළු වුනා.

දරුවනේ ඔයාලා වෙනුවෙන් මේ පුංචි "ළමා ප්‍රදීපය" මහත් සේවයක් කරනවා. ඔයාලා දන්නවනේ ප්‍රදීපයට 6 වසර සපිරුණා. මම වැඩි හිටියෙක් වෙලත් මමත් "ළමා ප්‍රදීපය " කියවන්නේ අපේ කතෝලික කම ගැන නොදන්නා ඉතිහාසයෙ මේ පත්තරෙන් දැනගන්න එක තමයි. ඉතින් අපි දෙවිසමිඳු පිහිට පතා චිරාත් කාලයක් "ළමා ප්‍රදීපය" දිදුලන්න කියල සමිඳු වරම් ඉල්ලමු. කිව්වා විතරයි විනිතා ඇන්ටි කේක් බන්දේසියක් ගෙනවිල්ලා බෙදුවා ඉන් පස්සේ සිසිල් පැන් එහෙම බොන්න දීලා සංග්‍රහ කළා. ජැන්ස් අංකල් කාමරය තුළට ගිහිල්ලා ලොකු පාර්සලයක් ගෙනවිල්ලා මේ අයට බෙද දුන්නා බැලින්නම් "ළමා ප්‍රදීපය" එක ගානේ කට්ටියටම බෙදුවා. කට්ටියම ස්තූති කරලා සතුටින් විසිර ගියා.

**ගෙලිඔය - ජුඩ් ජේ. ප්‍රනාන්දු මාමා**

---

**මාසික සිතිවිල්ල**



**"නොවැම්බර් මාසය"**

ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

සේයා :-
**ශ්‍රියාංගණී පීරිසියා**

---

## ගස

පුලුන් වළා පොදි අහසේ පාවී සැමතැන — විසිරෙනවා
හිම මෙන් පිවිතුරු වළා ටිකින් ටික කලුවට — බරවෙනවා
උහුලා ගනු බැරි වළා පොදිය විත් මිහිකත — විසිවෙනවා
ආසිරි මල් සේ වැහි විසිරීලා දෙරණ සතුටු — වෙනවා

ඒ දිය දහරින් තෙමුණු බීජයෙන් පැළයක් — මතුවෙනවා
ලා දළු කොළපත් හෙමිහිට වැඩි වී පැළය ගසක් — වෙනවා
ගහේ මල් පිපී, එල බර විලා, අනුනට ඒ — දෙනවා
කල්ගත වී ගොස් මහා රුකක් වී සැමට සෙවන — දෙනවා

බඩගිනි නිවලා, සෙවනත් දීලා මහ ගස තුටු — වෙනවා
අපේ කුරිරු සිත හන්දා පොරවක් අපේ අතට — එනවා
''ලී බඩු හදනට අපුරු ගස නොවැ'' හේතුපාඨ — දෙනවා
පරිසරයක වටිනාකම නොදන්න මිනිසුන් බිහි — වෙනවා

අහසෙන් ආ දිය පොළවෙන් උරලා පිපාස නැති — වෙනවා
තමන්ම හදනාආහාරයකින් ගස ජීවත් — වෙනවා
නිසොල්මනේ ඉන්නා මහ රුක් රජ තේජස — පෙන්වනවා
අනේ මිනිසුනේ රැකගනු මේ ගස මහත් පිනක් — වෙනවා

**ෆ්‍රීඩා විල්ලවරායන් – ටොරොන්ටෝ කැනඩාව**

# සතුටු කඳුළු



පෑයූ හිරු රශ්මිය ඇයගේ සමේ රන්වන් පැහැය වෙනස් කර ඇති බව ඇයව දකින ඕනෑම අයෙකුට තේරුම් යයි. තද දුඹුරු පැහැ ඇගේ සම මඳක් ළා පැහැ ගන්නේ සඳුගේ සිසිලස ලැබුණු විටය. සිහින් අහිංසක දෑස් අයිති වනු ඇයගේ කෙහෙරල්ල කිතුල් රුකකට සමාන කළ හැකි වුවත් එයද මඳක් දුඹුරු පැහැයට හුරුය. සිහින් සිරුරකට ඈ හිමිකම් කිවේ ඇගේ මවගේ හා පියාගේ උරුමයෙන් බව කෙනෙකුට සිතෙන්නට හැකි වුවත් ඔවුන්ගේ සිරුරු එලෙස සිහින්වුයේ ආහාර හිඟකම නිසාය. ඇය ඉපදුන දා සිට දුටුවේ අනෙක් ළමුන් දකින හරිත වර්ණය නොවේ. හිරුගේ රෞද්‍ර බැල්මට හසු වූ කටුක කහ පැහැයකට හුරු පරිසරයක් ඇයට හුරු වුයේ මේ ප්‍රදේශයේ පතොක්, නවහන්දි වැනි ශුෂ්ක කලාපීය ශාක වර්ග පමණක් එහි වැඩෙන නිසාවෙනි. ඇය ඉපදුන දින ජිනදාසට හා රම්‍යාට සුබ වුවත් ඇයගේ ජීවිතයට ශුභ වූ දිනක් නොවේ. මන්ද එදින එම ප්‍රදේශයේ දරුණු වසංගතයක් වූ බැවිනි. ඉපදී දින දෙකකට පසු ඇයට ද එම රෝගය වැළදුණත් ආශ්චර්යයක් ලෙස එම ප්‍රදේශයේ වෙදදුරන්ට වසංගතය සමනය කළ හැකි විය. එයින් ඇයද නව ජීවයක් ලැබුවාය. දෙව්දුවන් සේ එයින් ඇය මිදුණු හෙයින් ඇය ''දෙව්ලි'' ලෙස නම් ලැබීය.

මේ සිදුවීම ඇයට පසක් කරනු වස් දුඹුරුවන් වටකුරු ලපයක් ඇයගේ පිවිතුරු මුහුණෙහි නිකටහි වම් පසට වන්නට ඇත. අන් අයට එය ඇයට ලැබුණු චමත්කාර ලපයක් ලෙස පෙනෙයි. මෙම ප්‍රදේශයේ වගා කටයුතු කිරීම අපහසු හෙයින් ජිනදාස කිතුල් හකුරු නිපදවන කර්මාන්තයක නියුතුව සිටියේය. ඒ ලැබෙන සොච්චමෙන් යන්තම් වේල පිරිමහ ගන්නා මොවුන් සැබවින්ම දිලිඳු බවට සාක්ෂි දැරූහ. ඔවුන් ජීවිත් වූ පැල්පතේ පොල් අතු තුළින් හිරු එළිය වැටී ගෙය ආලෝකමත් කරයි. තම මවගේ හා පියාගේ ස්වල්ප අධ්‍යාපන දැනුම ලැබූ දෙව්ලිට තව දුරටත් ඉගෙනීමට වුවමනාඋවත් ආර්ථික ගැටලු යන අසිපත ඇය දෙසට දික් වුයේ ඇය ගැන කිසිදු අනුකම්පාවක් නොමැතිවය. එයින් ඇය සැලුණේ නැත. ඇය හැකි පමණින් පුවත්පත් වල පිටු සොයා ගෙන කියවා කියවීම දියුණු කර ගත්තාය. මෙලෙස සෙමෙන් කාලය ගතවිය. ඇයට වයස අවුරුදු පහළොවක් පමණ වන විට මෙම ප්‍රදේශයට තිබෙනවාටත් වඩා දරුණු නියඟයක් පැමිණීම කාගේත් වේදනාවට හේතු විය. වතුර කඩිතිවල දිය පොදක්වත් නොවීය. ආහාර පාන හිඟවිය. හිරු කිසිදු අනුකම්පාවක් නොමැතිව තම ශක්තිය පෙන්වන්නට මෙන් තම හිරු කිරණ ඇයගේ සම මතටම පතිත කරන්නා සේය. හමන මඳ නල වත් ඇයට හෝ ප්‍රදේශයට සැනසුමක් නොවීය. අවසානයේ ජිනදාස තම බිරිඳ හා දියණිය රැගෙන එම ප්‍රදේශයෙන් පිට විය. දුම්රිය ස්ථානයට පයින්ම ගමන් කළ මොවුන් ගෙන් හැඩුවේ දෙව්ලි පමණි. තම දියණිය හඬන්නේ කුමටද? මේ කටුක රශ්මිය , තමන්ගේ සම කේෂය අවලස්සන කරන මේ රශ්මිය ගත වෙහෙස කිරීමට හමන සුළඟ හරියාකාරව ආහාරයක් ලබානොදෙන මේ ප්‍රදේශය පිළිබඳව තම දියණියට ඇති හැඟීම කුමක්ද? ජිනදසට හා රම්‍යාටවත් වටහා ගත නොහැකි විය. නමුත් දෙව්ලිට මේ ප්‍රදේශය තමා උපන් බිම යයි අමතක කළ නොහැකි විය. දුම්රියට ගොඩවූ මොවුන් ආසන වල අසුන්ගෙන තමන් මෙතරම් කලක් වේදනා විදිමින් හෝ විසූ මේ භූමියට සමුදුන්නේය.

දුම්රිය ගමනාරම්භය සනිටුවන් කළේය. පැයකට පමණක් පසු වුන් මුහුදු වෙරළ අසලින් ගමන් කරන්නට විය. සිදුවුයේ නොසිතූ සිදුවීම් මාලාවකි. මුහුදු රළක් ප්‍රචණ්ඩත්වය දෙව්ලි හැදින ගත්තේ මේ මොහොතේය. ඒ සුනාමි තත්ත්වයක් යැයි දැනගැනීමට තරම් දෙව්ලි හපනියක් නොවුවාය. සුදු පෙණපිඩු නගමින් මිනිසුන්ගේ දෙපාදෝවනය කරමින් සන්සුන්ව නිසලව තිබෙන මුහුද මෙතරම් ප්‍රචණ්ඩත්වයක් ගනියි කෙසේ නම් සිතන්නද? දෙව්ලිට ඇසුනේ තම මවගේ හා පියාගේ දයාබර හා ලයාන්විත හඬ පමණි. ඒ ශෝෂාකාරී හඬ මැද ඔවුන් දෙදෙනාගේ හඬ පමණක් ඇසීම කිනම් ආශ්චර්යයක්ද? ගත වුයේ කොපමණ කාලයක්ද කියා දෙව්ලි නොදත්තාය.

ඇයට සිහිය ලැබෙන විට ඇය සිටියේ සුදු ඇතිරිල්ලක් දැමූ යහන් ගැබකය. ඇය හිඳගත්තාය. විශාල මිනිස් සංඛ්‍යාවක් මැද ඇය තම මව හා පියා සෙව්වාය. ඔවුන් සොයාගත නොහැකි වුයෙන් ඇයට අන් හැමදෙනාටම ක්ෂණිකව පහලව අදහස එනම්'' මව හා පියා මිය ගිහින්'' යන්න හැඟිනි. ඇය හිස බඳාගෙන හඬන්නට විය. ඇය තමාවත් දෙව්දුන් වෙත නොගත්තේ ඇය දැයි විමසීය. ඇය කල්පනා කළාය. තමන් අතින් වූ දෙවිඳුන් වෙත වූ වරද කුමක්ද? ඈ අතින් වුවානම් වුයේ අසනීප වූ විට ජපමාල උච්චාරණය නොකිරීම පමණි. ඒ කුඩා වරදට මෙතරම් දඬුවමක්? සුළඟක් හැමීය. එය සිසිල් ද උණුසුම් ද නිසා ඇයට වටහා ගත නෙහැකි විය. ඇයගේ උරහිස මත කවුරුන්හෝ අත තබනු ඇයට යාන්තම් දැනුණි. ඇය කැළඹුණු හා බියකරු දෙනෙතින් යුතුව පිටුපස බැලීය. ''දෙවියන් වහන්සේට ස්තුතිවේවා? මගේ මව හා පියා තවම මා අසලම මා ඉදිරිපිටම සිටියි.'' ජිනදසත් රම්‍යත් තම දියණිය වැළඳගෙන කඳුළු වගුරන්ට විය. ඒ කඳුළු ඉතා උණුසුම් බව දෙව්ලිට වැටහිණි. එහෙයින් ඒ සතුටු කඳුළු බව ඇයට ප්‍රත්‍යක්ෂ විය. දෙව්දුන් මෙතරම් බියකරු මොහොතකදී වුවත් තම මව හා පියා මෙන්ම තමාවද ආරක්ෂා කිරීම ප්‍රාතිහාර්යයක් ලෙසම දෙව්ලි තම සිතෙහි සනිටුවන් කරගත්තාය.

**නිමේෂා සත්සරනි**
09 ශ්‍රේණිය
ශා. සෙබස්තියන් දහම් පාසල - මොරගොඩ

## ළමා ප්‍රදීපයට උපරිම දයකත්වය දෙන මීසම්

| මීසම | අලෙවි කරන පුවත්පත් සංඛ්‍යාව | මීසම | අලෙවි කරන පුවත්පත් සංඛ්‍යාව |
|---|---|---|---|
| කටුකුරුන්ද (කළුතර) | 142 | කරමගඩෙ | 78 |
| පමුණුගම | 118 | නාත්තන්ඩිය | 75 |
| බටගම | 105 | දියලගොඩ | 70 |
| නිට්ටඹුව | 100 | හපුගොඩ | 70 |
| එඬේරමුල්ල | 95 | වැල්ලවීදිය | 70 |
| වැලිවේරිය | 90 | නාගොඩ (කඳාන ) | 70 |
| බෝලවත්ත | 89 | දෙහියාගත | 68 |
| වග | 82 | තඹරවිල (ගොඩැල්ල) | 67 |
| මාරවිල | 80 | අවිස්සාවෙල්ල | 65 |
| තරාල | 80 | වාද්දුව | 65 |
| කඩවත | 80 | පුත්තලම | 63 |

**මේ දූ දරුවන්ට, දිරිගන්වන ගුරු භවතුනට අපගේ හෘදයාංගම ශුභාසිංසනය**

**සංස්කාරක පියතුමා**

## තරාල දහම් ළමුන්ට විශේෂ දෙසුමක්

තරාල සිරිකුරුස දහම් පාසලේ 8 - 9 ශ්‍රේණිවල ළමුන් සඳහා ''යොවුන් වියට අභියෝගයක් වූ අද මාධ්‍ය'' තේමාව යටතේ විශේෂ දෙසුමක් 2014 නොවැම්බර් 30 වන ඉරුදින එම දෙව්මැඳුරේදී පැවැත්වේ.

මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. මීසම් සේවක ගරු සුමිත් රෝෂන් පියතුමාගේ අනුශාසකත්වයෙන් මෙය සංවිධානය කරයි. **එම්.ජෝ.පාරිස්**



කොටුගොඩ මීසමේ කොටුගොඩ, ඒකල, කාර්මික ජනපදය සහ කෘෂ්වත්ත දේවස්ථාන වලට අයත් ධර්මදූත ළමා සමාජවල ළමුන්ගේ එකමුතුවක් පසුගියදා කෘෂ්වත්ත දේවස්ථාන භූමියේදී තුඩැල්ල දිසා ධර්මදූත අධ්‍යක්ෂ ගරු ගයාන් ප්‍රසන්න පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මෙහිදී විවිධ තරඟ ඉසව් පැවති අතර දිව්‍ය පූජාව කොටුගොඩ මීසම් සේවක ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු පියතුමන් විසින් පැවැත්විය. ප්‍රථම වරට පැවැති. මෙම එකමුතුව හා ක්‍රීඩා උත්සවය සංවිධානය කරන ලද්දේ මීසම් සහයක ගරු ප්‍රදීප් සුරේශ් පියතුමා සහ ධර්මදූත සජීවික සජීවිකාවන් විසිනි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ. **මැල්කම් සිල්වා**



පේරලන්ද ළඳරු ජේසු පෙර පාසලේ පාලිකා නදීෂා ගුණතිලක මහත්මියගේ සංවිධානයෙන් එහි සිඟිත්තෝ දෙමාපියන් සමඟ කැළණිය ''වෝටර් වර්ල්ඩ්'' හා බත්තරමුල්ල ''අපේ ගම'' වෙත විනෝද චාරිකාවක යෙදුනහ. සහභාගී වූ පිරිස සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

**සී.ආර්. ඩික්සන් ඇන්ටනි**

### ළමා ප්‍රදීපය නත්තල් කලාපයට නිර්මාණ එවන්න.

ළමා ප්‍රදීපය විශේෂ නත්තල් කලාපය සඳහා නත්තල හා බැඳි ඔබගේ නිර්මාණ ( සැදැස්, නිසැදැස්, ලිපි, කෙටි කතා ) අප වෙත යොමු කරන්න. ඔබගේ නිර්මාණ දෙසැම්බර් 08 වන දිනට පෙර, ළමා ප්‍රදීපය "නත්තල් කලාපය" අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08. යන ලිපිනයට අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා**

# ධර්මදූත ළමුන්ගෙන් ජපමාල රැළියක් !








කඳාන මීසමේ ධර්මදූත ළමා සමාජයන් ළමෝ එක්ව ජපමාල රැළියක් පැවැත්වූහ. මෙහිදි ළමුන් අධිකාරිමුල්ල සිට සා. සෙබස්තියන් මාවත දක්වා ගමන් කළ අතර සා. සෙබස්තියන් මාවතේදී මෙය පැවැත්වුණි. මේ අවස්ථාවට කඳාන දිසා ධර්මදූත ළමා සමාජ අධ්‍යක්‍ෂ ගරු කෘෂන් කුමාර පියතුමන්ද එක්විය. කඳාන මීසම් සහයක ගරු දුලිප් කමල් පියතුමන්ගේ අනුශාසකත්වයෙන් සජීවක සජීවිකාවන් විසින් මෙහි කටයුතු සංවිධානය කෙරෙනි. **පියල් ජයකොඩි**

# ළමා ලේඛක වැඩමුළුවකට එක්වූ කඳාන මීසමේ ධර්මදූත ළමෝ



කඳාන මීසමේ ධර්මදූත ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් පසුගියදා මීසම් ශාලාවේදී පැවැත්වුණි. මෙය මෙහෙයවුයේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. මීසම් සහයක ගරු දුලිප් කමල් පියතුමන්ගේ අදහසකට අනුව සජීවක සජීවිකාවන්ගේ සහයෝගයෙන් මෙය සංවිධානය කෙරෙනි. දේශක මහතා සහ මීට එක්වූ ළමුන් ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනි සිටි අයුරු. **උමාලි රංගිකා**

## මව් සෙනෙහස

දස මසක් කුස දරා මා හැදු පෙම්බර අම්මා
ලේ කිරි කර පොවා මා ඇඩි කළ අම්මා
සැමදුක් දරා ගෙන මට යහමග පෙන්නා
ආදර මැණියෙනි, ඔබ පා වදිමි මෙමා

**හිමාෂි භාග්‍යා**
**03 ශ්‍රේණිය**
**සා. ලුවිස් දහම් පාසල - කොටරුපේ**
**(රද්දෙළුගම මීසම)**



## හොඳ සිරිත් පුරුදු වෙමු

කුඩා කාලයේ සිට හොඳ සිරිත් පුරුදු වුවහොත් යහපත් පුරවැසියෙක් විය හැකි ය. මවට පියාට වඳින දරුවා වැඩි හිටියන්ට සළකයි. උපකාරයක් අවශ්‍ය අසරණ කෙනෙකුට උදවු කිරීමට මැලි විය යුතු නොවේ. මව් පියන් හා ගුරුවරුන් දෙන අවවාද පිළිපැදීම කුඩා අපි කළ යුත්තෙමු. උදෑසන පිබිදුනු විට මෙන්ම නින්දට යන විටද දෙවිදුන් නමදිමු.

**තරූෂ පැහැසර**
**05 ශ්‍රේණිය**
**කුඩාමඩු දහම් පාසල - දෙහියාගාත**




## කිතු සමිඳුන්



සැමවිට දිවියේ වීරයා ඔබයි
සැමවිට මාගේ මිතුරාණන් ඔබයි
මා අසරණ වූ විට
සහනය සලසා දුන්නේ ඔබයි
මා ශක්තිමත් කළ උතුමාණෝ ඔබයි
නෑ හිත මිතුරන් මා තනි කළ විට
මනු ස්වරූපය ගෙන
මසිත නැළවුයේ ඔබයි
මසිත පවට බරවන විට
යහමග පෙන්වුයේ මා දිවියේ
සැබෑ මිතුරාණන් ඔබයි

**දිලීප මධුෂාන්**
**11 ශ්‍රේණිය**
**අගරදගුරු පිරිමි මහා විදුහල - නායකකන්ද**

## කෙත් යායක සිරි



මුළු යායක් පුරා
කොල සාරියක් එලුවා සේ
නිල්ල ගැසුණු කෙත් යායක්
දිස්වෙනවා සැම පැත්තෙන්
රන්වන් පාටින් දිලෙනා වී කරල්
කිරට දෙකට තුනට නැමෙනවා
බඩ පිරෙන්න වී
කැමට එන සියතොන්
පඹරාලට බිය වැදිලා දුකින් යනවා

**ඈන් පියුමි සපරමාදු**
**08 ශ්‍රේණිය - ශා. රෝකුස් දහම් පාසල - දැලතුර**

## ශු. මරිය මග්දලේනා

සිත් සසල කළ සත් යකුන් බිය
මොහොතකින් නැසුනා සිත් අඳුරු කළ
මහා පාපය මොහොතකින් බිඳුනා
ආදරේ සුව දැනුනු සෙනහස
නෙත් ළඟම රැදුනා
මහා සැනසිලි පපු තුරුල්ලේ
මොහොතකින් ලැබුනා
නොකළ මහ පව් කඳක් උරුම කොට
ගල් ගැසු මරියා
කිතු සමිඳුගේ ජයග්‍රහණයෙදි
පාමුලම වැටුනා
ලොවට හඬගා කියන නාමය,
ගලීලයේ සිටු කුමරිය වන
ශු. මරිය  මග්දලේනා



**ඇන්ටන් හංසික**
**11 ශ්‍රේණිය**
**මග්දලා දහම් පාසල - දුංගාල්පිටිය ( කැපුන්ගොඩ මීසම )**

## අසිරිමත් මැවිල්ල

කඳු පෙළ අතරින් හිරුනැග එන්නේ
රන්වන් හිරු රැස් අවට සිඹින්නේ
විහඟුන්ගේ නද අවට ඇසෙන්නේ
වනයක අසිරිය කියා පාන්නේ

කොළවන් පාටින් තුරු නැළවෙන්නේ
වියනක්සේ රුක් ගොමුව පෙනෙන්නේ
ගතට සිතට සුවයක් ගෙන දෙන්නේ
දේව මැවිල්ලක අසිරි පෙනෙන්නේ

**සහන්‍යා දෙව්මිණි**
**04 ශ්‍රේණිය**
**ශු. ප්‍රැන්සිස් අසීසි දහම් පාසල - උඩුගම්පල**
**(බුරුල්ලපිටිය මීසම)**

# Unknown Catholic Saints

## St' Zita

### *Feast Day - (April 27)*



*The body of St Zita lies in the Basilica of San Frediano in the central Italian city of Lucca*

You can see St Zita in the Basilica of San Frediano in Lucca, lying in a glass case. Her face is blackened and her skin paperfrail, yet she seems remarkably well-preserved for someone who died - what? - perhaps 200 years ago.

In fact, Zita lived between c1218 and 1278. Born at Monte sagrati into a poor but extremely religious family - her elder sister became a Cistercian nun, and her uncle Graziano was a much revered hermit - Zita found work at 12 in Lucca, as a servant in the house of one Pagano di Fatinelli, who prospered from the manufacture of woollen and silk garments.

Zita's exemplary industry at first stirred the enmity of the other domestis. "A servant is not good," she would tell them, "if she is not industrious: workshy piety in people of our position is sham piety."

As if that were not sufficiently irritating, she would reprove her fellow workers for their bad behaviour and foul language. And when a male servant made improper advances, Zita defended herself by scratching his face.

Gradually, though, her transparent goodness won over everyone in the household, including her master and mistress.

Several miracles were attributed to her, usually in connection with her concern for the poor.

Thus, when she gave away her master's food to feed the hungry, the victuals were unaccountably replaced.

Again, after she had excited Pagano's fury by handing his fur coat to a beggar, a stranger - or was it an angel? - arrived to return it. Zita was also esteemed for her charity to the sick, and to prisoners. Her few free moments were spent in the church of San Frediano, where she was buried. Exhumed three centuries later in1580, her corpse was discovered to be in excellent condition.

Employers held her up as a fine example to their servants, and canonisation followed in 1696. Among her specialities is finding lost keys.

Curiously, after Zita's death in 1278 her cult became popular in England, on account of the many Lucchese merchants in London.

Devotion to St Sithes, as she was called, gradually spread across the country, from Cornwall to Northumberland. More than 50 15th-century representations of her are to be found in English churches.

Chapels were dedicated to Zita at St Benet Sherehog (destroyed in the Fire of London), ,and in Norwich cathedral; and an altar was consecrated to her in St Albans Abbey.

At Mells, in Somerset, she is depicted in stained glass, holding three loaves and a book. The church at Eagle, in Lincolnshire, claimed to possess some of her hair, along with her little toe.

Once a year St Zita is paraded through the streets of Lucca. It is impossible to tell, however, whether she is missing a little toe.

# ශ්‍රී ලංකා කතෝලික සභාවේ ප්‍රථම වරට...



සා. ලුසියා ආසන දෙව්මැදුර

**ආදර දරුවෙනි,**

ලංකා කතෝලික ඉතිහාසයේ ප්‍රථම ස්ථානය හිමිවන හෙවත් ප්‍රථම වර වූ සිදුවීම් රැසක් අප ජනතාව ගේ දැනගැනීම සඳහා සටහන් කිරීම මෙම ලිපියේ අරමුණ යි.

දිවයිනේ රෝමානු පිළිවෙත් අනුව ලතින් බසින් ප්‍රථම දිව්‍ය පූජාව ඔප්පු කරන ලද්දේ ෆ්‍රැන්සිස්කාන නිකායට අයත් වින්සෙන්ටේ පියතුමන් විසින් ය. එය පුද කරන ලද්දේ 1505 අග භාගයේ කොළඹ ඉදිකරන ලද කුඩා දෙව්මැඳුර තුළ ය. ලේඛනගත වී ඇති සැටියට ප්‍රථමවර පවත්වන ලතින් දිව්‍ය පූජාව මෙය වන්නේ ය.

පෘතුගීසින් අල්ලාගත් රටවල් අතර ආසියාවේ පිහිටුවන ලද ප්‍රථම රදගුරු වසම වන්නේ ගෝවේ රදගුරු පදවියයි. එය පිහිටුවන ලද්දේ ක්‍රි.ව. 1534 දී ය. පෘතුගීසි ජාතික ගිහියකු, රදගුරුතුමකු පත්කරනු ලබන තෙක් මෙහි පරිපාලනය ගෙන ගියේ ය. ක්‍රි.ව. 1538 දී ෆ්‍රැන්සිස්කාන නිකායට අයත් ස්පාඤ්ඤ ජාතික අතිගරු ජුවාම් ද ඇල්බකර්ක් හිමිපාණන් රදගුරු වශයෙන් පත් කරන ලදුව පරිපාලකව සිටි මිගෙල් වාස් කුටීනෝ මහතා අනුනායක වශයෙන් පත් විය.

එවකට මුළු දිවයින ම අයත් වූ ප්‍රථම රදගුරු වසම ද මෙය යි. දිවයිනේ ධර්මදූත කටයුතු සඳහා ක්‍රියාත්මක වී ඇති ප්‍රථම පැවිදි නිකාය ෆ්‍රැන්සිස්කාන නිකාය යි. එතුමන්ලා ක්‍රි.ව. 1543 දී මෙහි එවන ලද්දේ තුන්වැනි ජුවාම් පෘතුගීසි රජු විසිනි. ප්‍රථම වරට සංවිධානාත්මකව ධර්මදූත මෙහෙවරක් අරඹන ලද්දේ ද එම නිකායේ පියවරුන් විසින් ය.

දිවයිනේ ප්‍රථම වරට පැවිදි ජීවිතයට ඇතුළු වී පැවිදි සොයුරියන් වූයේ යාපනය රජකළ පරරාස සේකරන් (1591 සිට 1615 දක්වා) ගේ දියණියන් දෙදෙනා ය. දෝනා ඉසබෙල් සහ දෝනා මරියා ලෙස ගෝවේ නුවර සාන්ත මොනිකා කන්‍යාරාමයේ දී පැවිදි ජීවිතයට ඇතුළු වූ මේ දෙදෙනා අප ප්‍රථම ලාංකික පැවිදි සොහොයුරියන් දෙදෙනා ය.

මෙම පැවිදි සොහොයුරියක හෙවත් දෝන මරියා ගරු බැහැදැකීමේ මරියා සොයුරිය නමින් සාන්ත මොනිකා කන්‍යාරාමයේ ශ්‍රෙෂ්ඨ මව්තුමිය (ඇබස්) ලෙසද පත්වුණා ය. මෙවැනි පත්වීමක් ලද ප්‍රථම ලාංකිකයා ඇය යි.

බ්‍රිතාන්‍ය යුගයේ දී දිවයිනට පැමිණි ප්‍රථම යුරෝපීය ධර්මදූතවරයාණන් වූයේ ගරු
අන්ද්‍රෙ- ෆ්‍රන්සුආ ඩුමාස් පියතුමා ය. එතුමා දිවයිනට පැමිණියේ ක්‍රි.ව. 1842 මුල් භාගයේ දී ය.

රෝමයේ ධර්මදාන කාර්යංශය මෙහෙයවීමෙන් දිවයිනට එවන ලද ප්‍රථම යුරෝපීය ධර්මදූත පියතුමා වූයේ ඉතාලි ජාතික ගරු ඔරාට්සියෝ බෙට්ටාකීනී පියතුමා ය.

ඉතාලියේ ඔරතෝරියාන නිකායට අයත් මෙතුමා දිවයිනට පැමිණියේ 1842 අග භාගයේ දී ය.

දිවයිනට ප්‍රථමයෙන් පැමිණි සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකායට අයත් පියතුමා වූයේ ගරු ජොසෙප්පෙ බ්‍රාව් පියතුමා ය. එතුමා මෙහි පැමිණියේ 1845 අගෝස්තු මාසයේදී ය.

ගැලවුම්කරුවාණන්ගේ නිකායෙන් හෙවත් රෙඩම්ප්ටොරිස්ට් නිකායේ ධර්මදූත කටයුතු සඳහා ප්‍රථම වරට දිවයිනට පැමිණියේ ගරු ෆ්‍රැන්සිස් සේවියර් මෙන්සේස් පියතුමා ය. ගෝවේ උපන් එතුමා ආසියාවෙන් එම පැවිදි නිකායට බැඳුනු පළමු පියතුමා ද වන්නේ ය.

ප්‍රථම වරට දිවයින තුළ රදගුරු තනතුර දරා ඇත්තේ ඉන්දියාවේ ඔරතෝරියාන නිකායට (ජුසේ වාස් පියතුමා ගේ නිකායට) අයත් අති උතුම් වින්සන්ටෙ ඩො රොසාරියෝ හිමිපාණන් ය. එතුමා ඉන්දියානු ජාතිකයෙකි. දිවයිනේ ප්‍රථම අපෝස්තලික අනුනායක වශයෙන් එතුමන් පත් කරන ලද්දේ ක්‍රි.ව. 1838 දී ය.

ප්‍රථම වරට දිවයිනේ රදගුරු තනතුර ලද යුරෝපීය ධර්මදූතවරයා අති උතුම් ඔරාට්සියෝ බෙට්ටකිනි හිමිපාණන් ය. එතුමන් ක්‍රි.ව. 1846 දී ලංකාවේ දෙවැනි අපෝස්තලික අනුනායක තනතුර දැරූ ඉන්දියානු ජාතික ඔරතෝරියාන නිකායේ අති උතුම් කයෙටානෝ ඇන්ටෝනියෝ හිමිපාණන් ගේ අනුප්‍රාප්තිකයා ලෙස පත් කරන ලදි.

දිවයින තුළ ම ප්‍රථම වරට රදගුරු අබිසෙස් ලද උත්තමයාණෝ වන සේ අති උතුම් ඔරාට්සියෝ බෙට්ටකීනි හිමිපාණෝ ය. රදගුරු වරම් ප්‍රදානය කිරීමේ පිළිවෙත් අති උතුම් කයෙටානෝ ඇන්ටෝනියෝ හිමිපාණන් ගේ ප්‍රධානත්වයෙන් කොටහේනේ සා. ලුසියා දෙව්මැඳුරේ දී පවත්වන ලද්දේ 1846 පෙබරවාරි මස 8 වැනි දා ය.

මීට පෙර දිවයිනේ දහම් සේවාව සඳහා පත් කරන ලද රදගුරු හිමිවරුන් දෙදෙනා ම ඉන්දීය ජාතිකයින් වූ නිසා එතුමන් රදගුරු අබිසෙස් ලැබුවේ ඉන්දියාවේ දීම ය.

(මෙම ලිපිය සඳහා දත්ත මාහිමි ඩබ්. එල්. ඒ. දොන් පීටර් පියතුමන් ගේ ග්‍රන්ථ අනුසාරයෙන් ලබා ගත් බව ගුණවත්ව සඳහන් කරමි.)

**විශ්‍රාමික අගරදගුරු අති උතුම්**
**ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසිනි**

# පුංචි අපේ චිත්‍ර පිටුව



**මරිය තුමිය**

**පබෝදා මහේෂි**

07 ශ්‍රේණිය - ශු. පවුලේ දහම් පාසල - මිල්ලව



**ජාතික සමගිය**

**හෂනිකා කෞශල්‍යා**

06 ශ්‍රේණිය

ශා. ඇලෝසියස් දහම් පාසල - රඹුක්කන



**සැදෑ අසිරිය**

**දනෝද්‍යා සංකල්පනී**

06 ශ්‍රේණිය - සා. මරියා දහම් පාසල - හාල්දඩුවන



**අසිරිමත් පරිසරය**

**නිමේෂා අමෝදනී**

05 ශ්‍රේණිය - ශා. තෝමස් දහම් පාසල - මහව



**ගොයම් කැපීම**

**අංජලි ෂෙහාරා**

05 ශ්‍රේණිය - සා. මරියා දහම් පාසල - මාරවිල



**මෝස්තරයක්**

**මල්ෂා අංජලි**

09 ශ්‍රේණිය

සදාසරණ දහම් පාසල - විජයකටුපොත (අගුණවිල මීසම)

# සා. අගතා මුනිවරිය



**සුදුවර චරිතයක් හඳුනාගනිමු**



| | | |
|---|---|---|
| අරක්ගත් මුනිවරිය | : | පියයුරු හා පියයුරු පිළිකා රෝගීන්ගේ |
| ජීවිත කාලය | : | වර්ෂ 250 දී |
| මංගල්‍යය දිනය | : | පෙබරවාරි 05 |
| උපන් දේශය | : | කතානියා, සිසිලි දූපත |

ඉතාලියේ සිසිලි දූපතේ විශේෂයෙන් කතානියා නගරයේ ශු. අගතා මුනිවරිය පිළිබඳ බැතිය පැතිර ගොස් ඇති අතර එතුමිය පිළිබඳ ඓතිහාසික කරුණු ඇත්තේ ඉතා ස්වල්පයක් පමණි. මෙතුමිය කතානියා හි ප්‍රාණපරිත්‍යාගීවී ඇත. එතුමිය මිය ගිය කාලය නොදත්තද තුන්වන සියවසේ ඩේසියස් අධිරාජ්‍යයාගේ පීඩන සමයේ දී සිදුවුවක් ලෙස සැලකේ. සමහරුන්ට අනුව හතරවන සියවසේ මුල් වසර වල බව පැවසේ. එතුමිය පිළිබඳ භක්තිය හොඳින් පැතිර ගිය වර්ෂ 350 දී පමණ සා. අම්බෝස් සහ 1 වන ඩැමසස් පාප්තුමා සා. අගතාතුමිය ගැන ප්‍රශංසාත්මකව ලියා ඇත.

ජනප්‍රවාදයට අනුව සා. අගතා මුනිවරිය සිසිලි දූපතේ කතානියාහි විසූ ඉතාමත් සුරූපී ධනවත් ප්‍රභූ කාන්තාවකි. මිත්‍යාගමික කොන්සල්වරයකු වූ කුයින්යනුස් කාමාතුරාව ඈ දෙස බැලුවද ඇය ඒවා ප්‍රතික්ෂේප කළාය. ඔහු වෛශ්‍ය සේවයේ යෙදෙන අෆ්රොසිසිඅස් නැමති කාන්තාවක් වෙත අගතා මුනිවරිය යවමින් දින 30 තුළ දූෂණය කරන්නට කීය. එහෙත් අගතා මුනිවරිය ජයගත්තාය. කාන්තාව කියා ඇත්තේ " තද කළු ගලක් කැඩීම ඊට වඩා පහසුය යන්නයි " ඇගේ කිතුනු විශ්වාසයත් කන්‍යාභාවයේ කැපවීමත් එතරම් ශක්තිමත්ව තිබුණි.

තවත් වරක් ඇයට කවුන්සලය ඉදිරියේ පෙනී සිටිමට කීවාය. ඔහුගේ කාමුක ආශාව වෛරයට පෙරළී තිබුණි. කුයින්ටනුස් ඇගේ සිරුරේ අවයව වලට වේදනා දෙන්නට විය. පසුව ඇයගේ පයෝධර පෙති ගසන ලෙස වදකයාට ඔහු අණ කළේය. සිහි කල්පනා මද වූ එතුමියව මුරකරුවන්ගේ කුටියට ගෙන ගියෝය. වතුර දීමටවත් බෙහෙත් කිරීමටවත් තහනම් කළේය. සා. පේදුරු තුමා දර්ශනයවී එතුමියගේ පයෝධර නැවත යථාතත්වයට පත් කළ බව කියවේ. මේ ගැන දැනගත් කුයින්ටනුස් ඇයව අඟුරු ගොඩේ දමා මිය යන තුරු තබන්නට අණකළේය. ක්‍රිස්තියානින් ඇයව භූමදානය කළ අතර කුයින්ටනුස් අශ්වයා පිටින් යන කල අශ්වයා විසින් විසිකරනු ලැබ ගඟට වැටී ගිලී මළේය.

**අසේල දසනායක විසිනි**


ශුද්ධවූ බයිබලය ඇසුරෙන්
මෝසෙස්
75
සැකසුම, දෙබස්, චිත්‍ර
එවිට දෙවියන් වහන්සේ මෝසෙස්ට කතා කර..
හේයි.. මිනිසුනේ එහා ලෝකඩ වලින් සර්පයෙක් සාදා පල්ලා.. ඉක්මනින්..
එවිට පිරිස කඩිනමින් ලෝකඩ සර්පයෙක් සාදන්නට පටන් ගත්තේය
හැ: බොහොම හොඳයි නේද..
..මම මේ කණුව.. හදනව.
සියලු දෙනා එකතුවී ලෝකඩ සර්පයා සෑදීමෙන් පසු...
මේ සර්පයා දෙස බලා සිටපල්ලා.. දෙවියන්වහන්සේට විශ්වාස කරපල්ලා..
සර්පයා.. දෂ්ට කළ මිනිසුන් ලෝකඩ සර්පයා දෙස බලා යාඥා කරන්නට විය..
දෙවියන් වහන්සේට සතුටු වෙන්න මට දැන් හොඳටම සනීපයි.
ඔක්කොම මිනිස්සු මේ දෙස බලාපල්ලා.
කෝ කෝ මටත් බලන්ඩ ඕනි..
ලෝකඩ සර්පයා දෙස බලා සිට දෂ්ටලත් දෙනාම සුවපත් විය..
මේ සර්පයෝ ඔක්කොම ආපහු ඇදිලා යනවා..

# ප්‍රහේලිකා අංක 48

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | 2 | | 3 | ■ |
| | ■ | | ■ | | ■ |
| | ■ | | ■ | 4 | 5 |
| | ■ | | ■ | ■ | |
| | ■ | 6 | 7 | | |
| 8 | | ■ | | ■ | |

## හරහට

1. ක්‍රිස්තුන් වහන්සේ තම ඉගැන්වීම් වලට මෙම ගස බොහෝ විට යොදා ගත් සේක.

4. යක්ෂයා ක්‍රිස්තුන් වහන්සේව උස් තැනකට පමුණුවා , ලෝකයේ සියළු රට රාජ්‍යයන් හා ඒවායේ ..... ඉසුරු ද පෙන්වා, යක්ෂයාට වඳින්නේ නම් ඒවා ලබා දෙන බව කීවේය. මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ....................විශ්වාස කිරීම සෙවනැන්ලක් අල්ලා ගැනීම වැනියැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. . මෙහි හිස්තැනට සුදුසු වචනය.

8. මිනිසෙකුගේ ගමන් මග සමිඳාණෝ මෙහෙයවන සේක. එසේනම් යමෙකුට තමා................... මග තේරුම් ගත හැකිදැයි හිතෝපදේශයේ විමසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

## පහළට

1. ''ක්‍රිස්තියානි'' යන නාමය ගෝලයින්ට පළමු කොට දෙනු ලැබුවේ මෙහිදීය.

2. ක්‍රිස්තුන් වහන්සේ පන්දහසකට කෑම ලබා දීමේ සිද්ධියට පෙර මෙම මුහුදෙන් එගොඩට වැඩම කළ බව ශුද්ධවූ ජුවාම් තුමා පවසයි.

3. පව්කාරයා මනස්ථාපනය වී පැමිණෙන තුරු දෙව්පියාණන් වහන්සේ අත් නොහැර බලා සිටින බවත්, එසේ පැමිණි විට සන්තෝෂවන බවත් පෙන්වූ එක් උපමාවකි, නැති වූ ......... පිළිබඳ උපමාව. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. වෙහෙසවන , බර උසුලන සියල්ලෙනි, මා වෙතට එන්න. මම ඔබට ...... දෙමි. ක්‍රිස්තුන් වහන්සේ වදාල සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

7. ජෝසප්ගේ සහෝදරයන් ඔහු සමග ඊර්ෂ්‍යාවෙන් ජෝසප්ව මෙවැන්නක හෙලුවේය.

මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපකාර කරගත හැකිය. ශු. ලූක් 4/6, 15/8, ශු මාක් 11/20, ශු. මතෙව් 11/28 , ශු. ජුවාම් 6/1, ක්‍රියා 11/26, උපදේශකය හෙවත් සිරාක් 34/2, හිතෝපදේශය 20/24, උත්පත්ති 37/24

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා - කිරිමැටියාගාර**




## දළුගම සා. ප්‍රැන්සිස් සාලෙස් දහම් පාසල

දළුගම මීසමේ දළුගම සා. ප්‍රැන්සිස් සාලෙස් දහම් පාසලේ වාර්ෂික පොළ පසුගියදා දෙව්මැදුරු භූමියේදී පැවැත්වුණි. වර්ෂ අවසාන දහම් පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවය හා ඉදිරි දහම් වර්ෂය සඳහා අරමුදල් එක්රැස් කිරීම මෙය පැවැත්වීමේ අරමුණයි.

ශු. පවුලේ ගරු පැවිදි සොහොයුරියන්, දහම් ගුරු මණ්ඩලය සිසු දරු දැරියන් , ශිෂ්‍ය නායක නායිකාවන් හා දෙමව්පියන් එක්ව මෙහි කටයුතු සංවිධානය කෙරිණි.

## කලඑළිය ප්‍රාථමික විදුහල



කලඑළිය ප්‍රාථමික විද්‍යාලයේ දරු දැරියන්ගේ සිඟිති පොළ ඉකුත්දා දෙව්මැදුරු භූමියේදී පැවැත්වුණි. මෙම පොළ පාසලේ විදුහල් පතිනිය සහ ගුරු මණ්ඩලයේ සංවි ධානයෙන් පැවැත්වුණි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**ලෙස්ලි පෙරේරා**



# "පන්හිඳ" නව නිර්මාණකරුවන්ගේ පොත් ප්‍රදර්ශනය




කඳාන ද මැසිනොද් විදුහලේ ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය මඟින් සංවිධානය කළ සිසු නිර්මාණ 1028 කින් සමන්විත "පන්හිඳ" නව නිර්මාණකරුවන්ගේ පොත් ප්‍රදර්ශනය පසුගියදා විදුහලේ "සොඳුරු පීඨයේ"දී පැවැත්විණි. මේ සඳහා 3 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසු නිර්මාණ ඉදිරිපත් කර තිබුණි. පොත් ප්‍රදර්ශනය විවෘත කිරීම ද ලාසාල් නිකායේ ප්‍රාදේශාධිපති ගරු ඩෙන්සිල් පෙරේරා සහෝදරතුමා අතින් සිදුවිය.

- ඇන්ටන් ජයසූරිය



